**10-04-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, පරමාත්ම පියා, භාරතය ගලවාගැනීමට පැමිණ සිටියි. මෙකල ඔය දරුවන් පියාගේ උදව්කරුවන් බවට පත්වනවා. පෞරාණික දේශය වන්නේ භාරතය පමණයි.

**ප්‍රශ්නය:** උසස් අරමුණ කරා ඉහළ නැඟීමට ඔබට තිබෙන සුළු බාධක මොනවාද?

**පිළිතුර:** ඕනෑම දෙයක් පිළිබඳව ඔබට සුළු කැමැත්තක් හෝ තිබේ නම්, ආකර්ෂණයෙන් මිදුණු ආකල්පයක් ඔබට නොමැති නම්, හොඳ ඇඳුම් පැළඳීමට හෝ රස ආහාර කෑමට, ඔබගේ බුද්ධිය නියැලී තිබේ නම්, එවිට එම දේවල් ඔබට උසස් අරමුණ කරා ළඟා වීමට බාධා ගෙනෙයි. මේ නිසයි බාබා පවසන්නේ : දරුවනි, වාම් වන්න. ඔබ සෑම දෙයක්ම අමතක කළ යුතුයි. ඔබගේ සිරුර පවා සිහි නොකළ යුතුයි.

ඕම් ශාන්ති. මෙම භාරතය අවිනාශී දේශය බවත්, එහි මුල්ම නම භාරතය බවත් ඔය දරුවන්ට විස්තර කර දී තිබේ හින්දුස්ථාන් යන නම ලබා දුන්නේ පසුවය. භාරතයට ආධ්‍යාත්මික දේශය යැයි කියයි. පෞරාණික දේශය එයයි. නව ලෝකයේ, භාරත දේශය පැවති විට, වෙනත් දේශ නොතිබිණි. ප්‍රධාන ආගම් වන්නේ ඉස්ලාම්, බෞද්ධ සහ ක්‍රිස්තියානිය. දැන් බොහෝ දේශ තිබේ! අවිනාශී දේශය, භාරතයයි. එයට දෙව්ලොව, ස්වර්ගය යැයි කීහ. නව ලෝකයේ තිබෙන්නේ එක් භාරත දේශය පමණයි. නව ලෝකයේ නිර්මාණකරු වන්නේ, පරම පියා, පරමාත්ම ජීවය, දිව්‍ය ලෝකයේ නිර්මාණකරු, දිව්‍යමය දෙවි පියාණන්ය. මෙම භාරත දේශය, අවිනාශී දේශය බව, භාරත ජනතාව දන්නවා. භාරතය දිව්‍ය ලෝකය විය. කෙනෙක් මිය ගිය විට, ඔහු දිව්‍ය ලෝකයට ගිය බව මිනිසුන් පවසන්නේ, දිව්‍ය ලෝකය උඩ ඉහළ තිබෙන්නාක් මෙනි. ඔවුන් දිල්වාලා දේවාලයේ, දිව්‍ය ලෝකයේ ප්‍රතිමා පෙන්වා ඇත්තේ උඩ සිවිලිමේය. භාරතය, දිව්‍ය ලෝකයව තිබුණු බවත්, දැන් එය එසේ නොවන බවත් කිසිවෙකුගේ බුද්ධියට ඇතුළු වන්නේ නැත එය දැන් අපායයි. මෙය අවිද්‍යාවයි. කරුණු දෙකකි දැනුම සහ අවිද්‍යාව. දැනුමට දහවලද, අවිද්‍යාවට රාත්‍රිය යැයි ද කියයි. මෙවැනි කියමනකි 'උපරිම ආලෝකය සහ උපරිම අන්ධකාරය.' ආලෝකය යනු නැග්ම වන අතර, රාත්‍රිය යනු වැටීමය. මිනිසුන් ඉර බැසීම දකින්නට යන නමුත් එය සීමිත දෙයකි. මේ සඳහා කියා තිබෙන්නේ බ්‍රහ්මගේ දිවාකල සහ බ්‍රහ්මගේ රාත්‍රිය. බ්‍රහ්මා, ප්‍රජාවගේ පියාය. එබැවින් ඔහු අනිවාර්යයෙන්ම සියලුම මිනිසුන්ගේ පියාය. සත්ගුරු ඥානයේ තෙල ලබා දෙන විට, අවිද්‍යාවේ අන්ධකාරය මැකී යයි. ලෝකයේ කිසිම කෙනෙකුට මෙම දේවල් වැටහෙන්නේ නැත. මෙය නව ලෝකය සඳහා නව දැනුමයි. දිව්‍ය ලෝකය සඳහා, දිව්‍යමය දෙවි පියාණන්ගෙන් දැනුම අවශ්‍ය වෙයි. මෙසේ ගයති පියා දැනුමින් සපිරිය. එබැවින් ඔහු ගුරුවරයාය. පියා, පාරිශුද්ධකරු ලෙස හැඳින්වෙයි. වෙනත් කිසිවෙකුට පාරිශුද්ධකරු යැයි කිව නොහැක. ශ්‍රී ක්‍රිෂ්ණා වුවද එසේ හැඳින්විය නොහැක. සියල්ලන්ගේම පියා ඒකායන කෙනාය. ශ්‍රී ක්‍රිෂ්ණාට සියල්ලන්ගේම පියා විය නොහැක. ඔහු වැඩි වියට පත් වී විවාහ වූ විට, ඔහු දරුවන් එක්කෙනෙක් හෝ දෙදෙනෙකුගේ පියා වෙයි. රාධේ සහ ක්‍රිෂ්ණාට, රජ කුමරෙක් සහ රජ කුමරියක් යැයි කියයි. ඔවුන් යම් අවස්ථාවකදී විවාහ වන්නට ඇති. විවාහ වීමෙන් පසු පමණයි ඔවුන්ට දෙමාපියන් විය හැක්කේ. ඔවුන්ට දෙවියන්, ජගත් පියා, යැයි ඇමතිය නොහැක. පරමාත්ම දෙවියන්, ජගත් පියා යැයි කිව හැක්කේ ඒකායන අශාරීරික කෙනාට පමණයි. ශිව බාබාට, මීමුත්තා යැයි කිව නොහැක. මීමුත්තා වන්නේ ප්‍රජාපිතා බ්‍රහ්මාය පෙළපත් වෘක්ෂය හටගන්නේ ඔහුගෙන්ය. එම කෙනා, අශාරීරික දෙවි පියාණන්ය. ඔහු සියලුම අශාරීරික ජීවාත්මයන්ගේ පියාය. භක්ති මාර්ගයේ, මෙහි, ශරීර තුළ සිටින ජීවාත්ම, ඔහුට කන්නලව් කරති. ඔබ මේ සියලුම අළුත් කාරණා වලට ඇහුම්කන් දෙමින් සිටිනවා. මේවා නිවැරදිව කිසිම ග්‍රන්ථයක ලියා නැත. පරම පියා පවසන්නේ මා මෙහි අසුන්ගෙන ඔය දරුවන්ට පෞද්ගලිකවම විස්තර කරනවා. පසුව මේ සියලුම දැනුම අතුරුදහන් වනවා, පසුව, පියා පැමිණි විට, ඔහු නිවැරදි දැනුම ලබා දෙයි. ඔහු පෞද්ගලිකවම පහදා දී, උරුමය ලබා දෙන්නේ ඔය දරුවන්ට පමණයි. පසුකලකදී ග්‍රන්ථ නිර්මාණය කෙරෙනවා. සත්‍ය ලෝකය අවසන් වී එය මුසාවේ දේශය වන බැවින්, ඒවා නිවැරදිව නිර්මාණය කළ නොහැක. එබැවින් ව්‍යාජ දේ පමණක් තිබෙයි මන්ද, පරිහානියේ තත්ත්වය පමණක් තිබෙන නිසා. ඉහළ නැඟීමේ තත්ත්වය තිබෙන්නේ සත්‍යය සමඟින් පමණයි. භක්තිය රාත්‍රියයි. මිනිසුන් රාත්‍රියේ අන්ධකාරයේ වැටි වැටී සැරිසරයි ඔවුන් දිගටම ඔවුන්ගේ හිස නමයි. එතරම් උපරිම අන්ධකාරයක් තිබේ! මිනිසුන් කිසි දෙයක් නොදනී. ඔවුන් දිගටම දොරින් දොරට වැටි වැටී යයි. දරුවන් එය බලන්නට යන, මෙම සූර්යයාගේ නැඟීම සහ බැසීම තිබේ. ඔය දරුවන් දැන් දැනුමේ සූර්යයාගේ නැඟීම

දැකිය යුතුයි. භාරතයේ නැග්ම සහ භාරතයේ බැස්ම තිබේ. භාරතයද සූර්යයා මෙන්ම ගිලා බසී. සත්‍ය නාරායනගේ කතා පුවතේ, භාරතයේ ඔරුව ගිලෙන ආකාරය ඔවුන් පෙන්වයි. එවිට පියා පැමිණ එය ගලවා ගනී. ඔබලා නැවත වතාවක් මෙම භාරතය ගලවා ගන්නවා. මෙය වැටහෙන්නේ ඔය දරුවන්ට පමණයි. ඔබ මෙම ප්‍රදර්ශනය සඳහා ආරාධනාපත් යවන අතර, 'නව ලෝකය ගොඩනැගීම' නමැති එහි මාතෘකාව, නිවැරදිය. එය නව ලෝකය ස්ථාපනය කරන්නේ කෙසේද, යන්නෙහි ප්‍රදර්ශනයයි. මෙම විස්තර කිරීම, පිංතූර මඟින් ලබා දෙයි. එබැවින් එම නම පැවතෙන්නේ නම් හොඳයි. නව ලෝකය ස්ථාපනය කරන අන්දම සහ නව ලෝකයේ නැඟීම ඇති වන ආකාරය ඔබ පෙන්වයි. පැරණි ලෝකයේ බැස්ම අනිවාර්යෙන්ම තිබේ, නැග්ම ඇතිවන්නේ කෙසේද කියා ඔබ පෙන්වන්නේ ඒ නිසාය. ඔබ රාජධානිය හිමි කරගන්නා අන්දම සහ පසුව ඔබ එය අහිමි කරගන්නා අන්දම ගැනද කතාපුවතක් තිබේ. වසර 5000කට පෙර තිබුණේ කුමක්ද? සූර්ය රාජවංශික රාජධානිය තිබුණු බව කියැවෙයි. ඉන්පසුව චන්ද්‍ර රාජවංශික රාජධානිය ස්ථාපනය කරන ලදී. ඒ මිනිසුන් එකිනෙකාගෙන් රාජධානිය හිමි කරගනී. ඔවුන් අහවලාගෙන් රාජධානිය හිමි කරගත් අන්දම පෙන්වයි. ඔවුන්ට ඉනිමගේ පිංතූරය වැටහෙන්නේ නැත. ඔබ ස්වර්ණමය යුගයෙන් රිදී යුගයට ගිය අන්දම, ඔබ දිගින් දිගටම ඉනිමඟ දිගේ පහළට ගිය අන්දම විස්තර කරන්නේ පරමාත්ම පියා පමණයි. මෙය උපත් 84හි ඉනිමඟයි. ඔබ ඉනිමඟ දිගේ පහළට පැමිණ, ඉන්පසුව එය නැඟිය යුතුයි. පරිහානියේ රහස විස්තර කළ යුතුයි භාරතයේ පරිහානිය කෙතරම් කලක් පවතින්නේද, භාරතයේ නැග්ම, කෙතරම් කාලයක් පවතින්නේද, කියා ඔබ පෙන්වා දිය යුතුයි. පරිහානිය සහ නැඟීම තිබෙන්නේ භාරතයේ ජනතාව පිළිබඳවයි. මිනිසුන්ව පොළඹවන්නේ කෙසේද කියා, ඔබ දැනුමේ මහා සයුර ආවර්ජනය කළ යුතුයි. ඉන්පසුව ඔබ ඔවුන්ට ආරාධනා පත්ද යැවිය යුතුයි. 'සහෝදර සහෝදරියනි, පැමිණ වටහාගන්න!' පළමුවෙන්ම ඔවුන්ට පියාගේ ප්‍රශංසාව පවසන්න. එහි ශිව බාබාගේ ප්‍රශංසාව ඇති පුවරුවක් තිබිය යුතුයි එන්න, ඇවිත් ඔබගේ සූර්ය සහ චන්ද්‍ර රාජවංශික උරුමය, පාරිශුද්ධකරු, දැනුමේ මහා සයුර, පාරිශුද්ධත්වයේ මහා සයුර, සතුටේ සහ සාමයේ මහා සයුර, සමෘද්ධියේ මහා සාගරය, සියල්ලන්ටම විමුක්තිය පිරිනමන්නා, ජගත් පියා, ජගත් ගුරුවරයා සහ ජගත් ගුරු වන ශිව බාබාගෙන් හිමි කරගන්න. එවිට මිනිසුන් පියාව හඳුනාගනී. පියාගේ ප්‍රශංසාව, ශ්‍රී ක්‍රිෂ්ණාගේ ප්‍රශංසාවෙන් වෙනස්ය. මෙය ඔය දරුවන්ගේ බුද්ධිය තුළ තිබේ. සේවයට ලැදි දරුවන් දවස පුරාම එහෙ මෙහෙ දිව යයි. ඔවුන් තම ලෞකික රැකියාවන්ගෙන් පවා නිවාඩු ගෙන, ආධ්‍යාත්මික සේවයේ තමන්ව කාර්ය බහුල කරගනී. මෙය දේවමය රජයයි. ඔය දියණියන් විශේෂයෙන්ම එවන් සේවයේ නියැලෙන්නේ නම්, ඔබට බොහෝ සේ නාමය කීර්තිමත් කළ හැක. ශිව බාබාගේ නිධන් ගබඩාව පිටාර ගලන බැවින්, සේවයට ලැදි දරුවන් ඉතා හොඳින් පෝෂණය ලබනවා. ඔබ ආහාර ගන්නා නිධන් ගබඩාව සෑම විටම පිටාර ගලන අතර එය ඔබගේ දුක් වේදනා ඉවතලයි. ඔබ ශිවාගේ වංශයට අයත්ය. ඔහු නිර්මාණකරු වන අතර ඔහුගේ නිර්මාණය, මෙයයි. 'බබුල්' (පියා) යන නම, ඉතාමත් මිහිරිය. ශිවා, මනාලයාද වෙයි. ශිව බාබාගේ ප්‍රශංසාව මුළුමනින්ම අසහායයි. ඔබ 'අශාරීරික' යන වචනය ලියන විට, ඔහුට රූපයක් නොමැති බව ඔවුන් සිතයි. වඩාත්ම ආදරණීය කෙනා, ශිව බාබාය. ඔබ අනිවාර්යෙන්ම 'උත්තරීතර ලෙසින් ආදරණීය වූ' යැයි ලිවිය යුතුයි. මෙකල ඔවුන්ට සටන් බිමක් තිබෙන අතර, ඔබටද සටන් බිමක් ඇත. 'අවිහිංසක ශිව ශක්තීන්' සිහි කර තිබේ. කෙසේවෙතත්, ඔවුන් දේවතාවන් ආයුධ සමඟ පෙන්වා, ඔවුන් හිංසාකාරී ලෙසින් නිරූපනය කර ඇත. ඇත්ත වශයෙන්ම ඔබ ලෝකයේ ආධිපත්‍යය හිමි කරගන්නේ, සිහිපත් කිරීම සහ යෝගා බලයෙනි. ආයුධ ආදිය පිළිබඳ ප්‍රශ්නයක් නැත. ගංගා නදියේ බලපෑම බොහෝ සේ තිබේ. බොහෝ දෙනෙකුට දර්ශන ලැබෙයි. ගංගා නදියේ ජලය ගත් විට පමණක් ඔවුන්ට විමුක්තිය ලැබෙන බව, භක්ති මාර්ගයේ විශ්වාස කරති. අදෘශ්‍යමාන ගංගා නදිය ගැන ඔවුන් දිගින් දිගටම කතා කරන්නේ ඒ නිසාය. ඊතලය පතිත වුණු ස්ථානයේ, ඔවුන් ගව මුඛයකින් ගංගා නදිය මතු වන ආකාරය පවා පෙන්වයි. ගංගා නදිය මතු වූ බව, ඔවුන් පවසයි. ඔවුන්ගෙන් විමසුවොත්, අදෘශ්‍යමාන ගංගාවක් මතු වන බව, ඔවුන් පවසයි. ඔවුන් අදෘශ්‍යමාන සරස්වතිය, ත්‍රිවේනියේ (ගංගාවන් තුනක් හමු වන තැන) පෙන්වා ඇත. ඔවුන් බොහෝ කතා ගොතා තිබේ. මෙහි තිබෙන්නේ එක් දෙයක් පමණයි, ඇල්ෆා පමණයි, එපමණයි! අල්ලා පැමිණ, බාහිස්ත් (දිව්‍ය ලෝකය) ස්ථාපිත කරයි. දිව්‍ය ලෝකය ස්ථාපිත කරන්නේ කුදාය. ඊශ්වර, දෙව්ලොව ස්ථාපිත කරයි. ඇත්ත වශයෙන්ම පරමාත්ම දෙවියන් එක්කෙනෙක් පමණයි. ඔවුන් තම තමන්ගේ භාෂාවෙන් ඔහුට බොහෝ නම් දී තිබේ. කෙසේවෙතත්, ඔවුන්ට දිව්‍ය ලෝකයේ ආධිපත්‍යය, අල්ලාගෙන් ලැබෙන බව, ඔවුන්ට නිසැකයෙන්ම වැටහෙයි. මෙහි, පියා පවසන්නේ මන්මනාභව! පියාව සිහි කිරීමෙන් ඔබට නිසැකයෙන්ම ඔබගේ උරුමය සිහි වෙයි. නිර්මාණකරුගේ නිර්මාණය, දිව්‍ය ලෝකයයි. රාමා (දෙවියන්) අපාය නිර්මාණය කළ බව කිව නොහැක. අශාරීරික නිර්මාණකරු කවරෙක්ද කියා, භාරතයේ ජනතාව නොදනී. මිනිසුන් විසින් ඔහුගේ

පඹයෙක් පුළුස්සා දමන, රාවණ, අපායේ නිර්මාණකරු බව, ඔබ දන්නවා. රාවණගේ රාජධානියේ, භක්තියේ අංකුරය, ඉතා විශාල ලෙස වැඩෙයි! ඔවුන් රාවණගේ බියකරු ස්වරූපයක් නිර්මාණය කර ඇත. රාවණ, ඔවුන්ගේ සතුරා බවද ඔවුන් පවසයි. බොහෝ ව්‍යාප්තිය සිදු වී ඇති බව පියා විස්තර කර ඇත, ඔවුන් රාවණගේ විශාල ශරීරයක් සාදන්නේ මේ නිසාය. ශිව බාබා කුඩා තිතක් පමණක් වුවත් ඔවුන් ඔහුව පිළිඹිමු කරන්නේ විශාල ප්‍රතිමාවකිනි. තිතකට වන්දනාමාන කරන්නේ කෙසේද? ඔවුන් වන්දනාකරුවන් විය යුතුයි. ජීවාත්මය ගැන පවසා ඇත්තේ, නළල මධ්‍යයේ අලංකාර තාරකාවක් දිළිසෙන බවය. ඉන්පසුව ඔවුන් පවසන්නේ, ජීවාත්මය, උත්තරීතර ජීවාත්මය බවයි. එබැවින් ඔහු සූර්යයන් දහසකට වඩා දීප්තිමත් වන්නේ කෙසේද? ඔවුන් ජීවය ගැන කතා කරන නමුත් ඔවුන්ට එය වැටහෙන්නේ නැත. දෙවියන්, සූර්යයන් දහසකට වඩා දීප්තිමත් නම්, ඔහු සෑම කෙනෙක් තුළටම ඇතුළු වන්නේ කෙසේද? ඔවුන් බොහෝ වැරදි දේවල් පවසා ඇති අතර, ඒවාට සවන් දීමෙන්, ඔවුන් දැන් පත්ව ඇති තත්ත්වය දෙස බලන්න! ජීවාත්මයක්, උත්තරීතර ජීවාත්මය බව, ඔවුන් කියයි. එබැවින් පියාගේ ස්වරූපයද එයම විය යුතුයි. කෙසේවෙතත්, ඔහුට වන්දනාමාන කිරීම සඳහා, ඔවුන් ඔහුගේ ස්වරූපය විශාල කර ඇත. ගුහා තුළ සාදා ඇති පාණ්ඩවයන්ගේ ප්‍රතිමා තරම් උස ගල් ප්‍රතිමා, ඔවුන් සාදයි. ඔවුන්ට කිසි දෙයක් වැටහෙන්නේ නැත! මෙය ඉගෙනුමකි. ව්‍යාපාරයක් ඉගෙනුමකට වඩා වෙනස්ය. බාබා, ඔබට උගන්වා ඔබට ව්‍යාපාරයක්ද උගන්වයි. පුවරුවේ පළමුවෙන් පියාගේ ප්‍රශංසාවද තිබිය යුතුයි. පියාගේ සම්පූර්ණ ප්‍රශංසාව ලිවිය යුතුයි. ඔබ දරන උත්සාහයට අනුව අංක පිළිවෙලට, මෙම දේවල් ඔය දරුවන්ගේ බුද්ධිය තුළට ඇතුළු වෙයි, මේ නිසයි, ඇතුන් පිට යන්නන් සහ අශ්වාරෝහකයන් සිටින බව කියැවෙන්නේ. එය ආයුධ ආදිය පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. පරම පියා ඔබගේ බුද්ධියේ අගුල් විවර කරයි. මෙම ගොඩ්රිජ් අගුල් වෙනත් කිසිවෙකුට විවර කළ නොහැක. දරුවන් පියා හමුවීමට පැමිණෙන විට, බාබා ඔවුන්ගෙන් විමසන්නේ අපි මින් පෙර මුණගැසී තිබෙනවාද? අපි මෙම ස්ථානයේ, මෙම දිනයේ මින් පෙර හමු වී තිබෙනවාද? දරුවන් පිළිතුරු දෙන්නේ ඔව් බාබා, අපි වසර 5000කට පෙර මුණ ගැසුණා. වෙනත් කිසිවෙකුට මෙම ආකාරයෙන්ම මෙම දේවල් විමසිය නොහැක. මේවා වටහා ගත යුතු බොහෝ ගැඹුරු කාරණාය. බාබා බොහෝ දක්ෂ විවිධාකාර අන්දමින්, දැනුම පහදා දෙයි. කෙසේවෙතත්, ඔබ ඒවා ධාරණය කරගන්නේ අංක පිළිවෙලටයි. ශිව බාබාගේ ප්‍රශංසාව, බ්‍රහ්ම, විෂ්ණු සහ ශංකර්ගේ වර්ණනාවෙන් වෙනස්ය. එක් එක් කෙනාගේ චරිත කොටස, ඔහුටම වෙන් වූ එකකි. එක්කෙනෙකුගේ චරිත කොටස, තව කෙනෙකුගේ එකට සමාන විය නොහැක. මෙම නාට්‍යය සදාතනිකයි. ඉන්පසුව එය එම ආකාරයෙන්ම නැවතත් සිදුවෙයි. ඔබ අශාරීරික ලෝකයට යන අන්දමත් ඉන්පසුව ඔබගේ චරිත කොටස් රඟපෑම සඳහා, මෙහි පහළට පැමිණෙන ආකාරයත් දැන් ඔබගේ බුද්ධිය තුළ තිබේ. ඔබ යන්නේ සූක්ෂම දේශය හරහාය. ඔබ නැවත එන විට, සූක්ෂම දේශය නොපවතී. කිසි කෙනෙකුට සූක්ෂම දේශයේ දර්ශන නොලැබෙයි. එහිදී සූක්ෂම දෙශයේ දර්ශන ලැබීමට කිසි කෙනෙක් තපස්යාවේ නොසිටියි, මන්ද කිසි කෙනෙක් ඒ ගැන නොදන්නා බැවින්. සූක්ෂම දේශයේ බැතිමතුන් නොසිටියි. සූක්ෂම දේශය, දැන් නිර්මාණය කරන්නේ, ඔබට එවිට සූක්ෂම දේශය හරහා ආපසු යාමට සහ ඉන්පසුව නව ලෝකයට යාමට හැකි වීමටයි. මෙකල ඔබ දිගින් දිගටම එහි ගොස් ආපසු පැමිණෙයි. ඔබ දැන් විවාහ ගිවිසගෙන ඇති අතර මෙය ඔබගේ මවගේ නිවසයි. විෂ්ණුට පියා යැයි නොකියයි. එය ඔබගේ නැන්දා-මාමලාගේ නිවසයි. ගැහැනු දරුවෙක් ඇගේ නැන්ද-මාමලාගේ නිවසට යන විට, ඇයගේ පැරණි ඇඳුම් සියල්ලම ඇය තබා යයි. ඔබ මුළුමනින්ම පැරණි ලෝකය හැර දා යයි. ඔබගේ වාම් බව සහ ඔවුන්ගේ එය අතර විශාල වෙනසකි. ඔබ සම්පූර්ණයෙන්ම ආකර්ෂණයෙන් මිදී සිටිය යුතුයි. ශරීර අවධානයද බිඳ දැමිය යුතුයි. ඔබ මිල අධික සාරියක් පැළඳි විට, ඔබ සැනෙකින් ශරීර අවධානයට පත් වී, ඔබ ජීවාත්මයක් බව අමතක කර දමයි. මෙකල ඔබ සිටින්නේ පිටුවහල් කරය (සරළ බවින්) . සරළ බව සහ විශ්‍රාමික ස්ථිතිය යන දෙකම එකය. ශරීරය අත්හළ යුතුයි. එබැවින් ඔබ සාරිය අත් නොහරින්නේද? විටෙක, කෙනෙකුට ලාභ සාරියක් ලැබුණු විට, ඇගේ හදවත හැකිළී යයි. ඔබට ලාභ දෙයක් ලැබීම ගැන ඔබ සතුටු විය යුතුයි. හොඳ දේවල් ඉතා හොඳින් රැක බලා ගත යුතුයි. හොඳ ඇඳුම් පැළඳීම සහ හොඳ ආහාර ගැනීම වැනි සුළු දේවල්ද, ඔබගේ උසස් අරමුණ කරා ලඟා වීමට ඔබට බාධක වෙයි. අරමුණ බොහෝ ඉහළයි. භාර්යාවක් ඇගේ සැමියාට, ඔහුගේ හැරමිටියද අත් හැරීමට කියන, ආගමික කතාවක් ඔවුන් පවසයි. පරම පියා පවසන්නේ මෙම පැරණි ඇඳුම් සහ මෙම පැරණි ලෝකය යන සියල්ල අවසන් වීමටයි යන්නේ. එබැවින් ඔබගේ බුද්ධියේ යෝගාව, මුළු ලෝකයෙන්ම ඉවත් කර දමන්න. මෙයට අසීමිත අතහැරීම යැයි කියයි. සන්‍යාසීන්ට සීමිත අත්හැරීම එකල තිබුණු නමුත් ඔවුන් දැන් නගර තුළ පදිංචි වීම ආරම්භ කර තිබේ. පෙරකල ඔවුන්ට බොහෝ බලය තිබුණි. පහළට පැමිණෙන අයගේ ප්‍රශංසාවක් තිබෙන්නේ කෙසේද? අවසානය තෙක්ම අළුත් ජීවාත්ම, ඔවුන්ගේ චරිත කොටස් රඟපෑම සඳහා

දිගටම පහළට පැමිණෙයි. ඔවුන්ට කෙතරම් බලය තිබෙයිද? ඔබ සම්පූර්ණ උපත් 84ම ගනී. මේ සියලු දේ වටහාගැනීමට ඉතා හොඳ බුද්ධියක් අවශ්‍යයි. සේවය කළ හැකි දරුවන් තුළ, සේවය කෙරෙහි බොහෝ උද්යෝගයක් දිගටම තිබෙයි. දැනුමේ මහා සාගරයේ දරුවන්, බාබා කරන ආකාරයෙන්ම, උද්යෝගයකින් දේශන පැවැත්විය යුතුයි. මෙහිදී කෙනෙක් අධෛර්යයට පත් නොවිය යුතුයි. අච්චා.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබගේ බුද්ධිය තුළ අසීමිත නිරාශාව ඇති කරගන්න. එය දැන් ආපසු නිවසට යෑමේ කාලයයි. එබැවින් පැරණි ලෝකයට සහ පැරණි ශරීරයට ඇති ආකර්ෂණයෙන් මිදෙන්න.
2. නාටකයේ සෑම ජවනිකාවක්ම නරඹන අතර, ප්‍රබෝදමත්ව රැඳී සිටින්න.

**වරදානය:** ඔබ බාප්දාදාව ඔබගේ සහකරු කරගෙන, ඒ අනුව සෑම දෙයක්ම දෙගුණයක බලයකින් සිදු කරන සහජ යෝගීවරයෙක් වේවා.

ඕනෑම කාර්යයක් සිදු කරන විට, බාප්දාදාව ඔබගේ සහකරු කරගන්න, එවිට කාර්යය දෙගුණයක බලයකින් නිම වෙයි. ඔබටත් ඉතා පහසුවෙන් ඔහුගේ අවධානය ඇති වෙයි, මන්ද, ඔබ සමග නිරතුරුව සිටින කෙනෙක්ව ඉබේටම සිහි වෙයි. මේ අන්දමින් ඔබ සහකරුවෙක් වීමෙන් සහ ඔබගේ බුද්ධියේ නිරන්තරයෙන් සත්‍යයේ ඇසුර තිබීමෙන්, ඔබ සහජ යෝගීවරයෙක් වෙයි. මෙම ශක්තිමත් ඇසුර තිබීම නිසා, ඔබ සෑම කාර්යයක්ම දෙගුණයක බලයකින් සම්පූර්ණ කර සාර්ථකත්වය අත්දකියි.

**පාඨය:** මහාරතී කෙනෙක් යනු මායාගේ කිසිදු බාහිර බලපෑමකට කිසි විටෙක හසු නොවන කෙනෙකි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ශ්‍රේෂ්ඨ වීම සඳහා මිහිරිබව සහ නිහතමානිකමේ ගුණධර්ම ධාරණය කරගන්න.**

මිහිරිබව බ්‍රහ්මින් දිවියේ ශ්‍රේෂ්ඨත්වයයි. මිහිරියාව ඇති තැන පාරිශුද්ධත්වයත් තිබේ. පාරිශුද්ධත්වය නොමැතිව මිහිරිබව තිබිය නොහැක. නිරන්තරයෙන් මිහිරිව රැඳී සිටින්න. ඔබ සිදු කරන සේවයේ සාර්ථකත්වයේ පදනම මෙයයි. ඔබගේ බුද්ධිය තුල මෙම කුල්මත්බව තිබෙන තරමට, ඒ අනව ඔබගේ ක්‍රියා තුල නිහතමානිකම සහ වදන් වල මිහිරිබව තිබිය යුතුයි. එවන් කුල්මත්බවක් පවත්වා ගැනීමෙන්, කිසිම විටෙක පාඩුවක් සිදු නොවෙයි. සාර්ථකත්වය අත්කර ගැනීමට ඇති අය, නිහතමානීව සහ නිර්මාණශීලීව රැඳී සිටියි. ඔවුන් සෑම සිදුවීමකින්ම ගුණදම් අහුලාගෙන තමන්ව මිහිරි බවින් පුරවයි.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.